# ඓතිහාසික පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරයේ සිතුවම් හායන ක්‍රියාවලිය සඳහා බලපාන හායනකාරක පිළිබඳ අධ්‍යයනයක්

**හර්ෂණ එච්. ඒ. එස්.**[1]

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොකුණුවිට ග්‍රාමයේ පිහිටා ඇති ඓතිහාසික පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය අනුරාධපුර යුගයේ රජ කළ කීර්ති ශ්‍රී මේඝවර්ණ රජුගේ කාලයට අයත් වන බව විහාරබිමේ පිහිටි ශිලාලිපියෙන් පැහැදිලි වේ. අක්කර හතක පමණ භූමි ප්‍රදේශයක ව්‍යාප්ත වී ඇති මෙම විහාරයේ අඩි පනහක් තරම් උස ගල්තලාවක් මත පැරණි ලෙන් විහාර මන්දිරය, ස්තූපය හා බෝ මළුව පිහිටා තිබේ. ඒ අනුව ලෙන් විහාරයේ අභ්‍යන්තර සිවිලිමේ හා බිත්තිවල දක්නට ලැබෙන සිතුවම් මෙම පර්යේෂණය සඳහා උපයුක්ත කරගන්නා ලදි. එහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ කරුණු සම්පාදනය සිදුකරනු ලැබීය. එම සිතුවම් බ්‍රිතාන්‍ය පාලන සමයේ දී චිත්‍රණය කළ දකුණු ශෛලියේ සිතුවම් බවට හඳුනාගෙන තිබෙන අතර බුද්ධ රූප, දේව රූප, සංඝයා වහන්සේලාගේ රූප, නර්තන හා වාදන ඉරියව්වලින් සමන්විත ස්ත්‍රී-පුරුෂ රූප, බිනර මල් මෝස්තර, නෙළුම් මෝස්තර හා ලියවැල් මෝස්තර එම සිතුවම් අතර පැවතිය ද ඇතැම් සිතුවම් හඳුනාගත නොහැකි තත්ත්වයට ම හායනය වී තිබේ. ආර්ද්‍රතාවය, පෙඳපාසි බැඳී තිබීම, ලයිකනවල බලපෑම, බිත්ති ඉරි තැලීම, නව ඉදිකිරීම්වල බලපෑම හා මානව ක්‍රියාකාරකම් මෙම හායනක්‍රියාවලිය සඳහා බලපා ඇති ආකාරය හඳුනාගත හැකිය. මෙකී සිතුවම්වල තත් පුරාවිද්‍යාත්මක අගය විනාශ වීමට හේතුවන හායනකාරක කෙබඳුද? යන්න අධ්‍යයනය කිරීම හා ඒවාට සංරක්ෂණ විසඳුම් යෝජනා කිරීම මෙහි මූලික අරමුණයි. පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේදී ක්ෂේත්‍ර හා ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේද අනුගමනය කරන ලදි. ක්ෂේත්‍ර ගවේෂණය යටතේ මූලිකව ම ස්ථානීය නිරීක්ෂණයක් සිදු කළ අතර එහිදි අදාළ දත්ත වාර්තා කරගැනීම හා ඡායාරූපගත කිරීම සිදු කරන ලදි. ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල ගවේෂණයක නිරත වූ අතර එහිදි උක්ත විහාරය සම්බන්ධ ව තොරතුරු අන්තර්ගත ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය පරිශීලනය කරන ලදි. මූලිකව ම පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය සම්බන්ධ ව නිරීක්ෂණ වාර්තාවක් නොමැති හෙයින් එවැනි නිරීක්ෂණ වාර්තාවක් සකස් කිරීමේ අවශ්‍යතාව පවතින බවත්, වේගයෙන් හායනය වෙමින් පවතින සිතුවම් කඩිනමින් සංරක්ෂණය කළ යුතු බවත්, සිතුවම්වල තැම්පත් වී ඇති බැක්ටීරියා, ලවණ හා ඇල්ගී ඉවත් කිරීමට රසායනික හා යාන්ත්‍රික යොදාගත හැකි බවත්, ලෙන් විහාරයේ ඇතුළත වාතාශ්‍රය නිසි පරිදි කළමණාකරනය කළ යුතු බවත් නිගමනය විය.

**ප්‍රමුඛ පද :** කිත්සිරිමෙවන් රජමහා විහාරය, ලෙන් විහාරයේ සිතුවම්, හායනකාරක, හායන ක්‍රියාවලිය

[1]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. har5323sampath@gmail.com